කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

ශාස්ත්‍ර පීඨය

ජනමාධ්‍ය ඩිප්ලෝමා පාඨමාලාව - 2017

**DJ 04 – ප්‍රවෘත්තිකරණයේ ශිල්ප විධි**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න. කාලය පැය තුනයි.

---

01. 'ප්‍රවෘත්තියක් යනු කිසියම් මාධ්‍යයක් විසින් වාර්තා කරන ලද සිද්ධියක් හෝ අවස්ථාවකි.' මෙය දශක දෙකකට පමණ පෙර ප්‍රචලිත ව පැවති නිර්වචනයකි. මෙම නිර්වචනය පරීක්ෂා කොට සමකාලීන ව වලංගු වන නව නිර්වචනයක අවශ්‍යතාව පැහැදිලි කරන්න.

02. ආපදා කේන්ද්‍රීය පුවත් බොහෝ මාධ්‍ය ග්‍රාහකයන්ගේ තියුණු අවධානයට ලක් වී ඇති බව පර්යේෂණවලින් අනාවරණය වී තිබේ. ආපදා කේන්ද්‍රීය පුවත් යනු මොනවාදැයි පැහැදිලි කරමින් මේ ප්‍රවණතාව විමසන්න.

03. 'පුවත්පතක පරිපූර්ණත්වය පිළිබඳ අභිමතාර්ථය සහතික කෙරෙන්නේ ප්‍රාදේශීය ප්‍රවෘත්ති වාර්තාකරණය මගිනි.' අදහස් දක්වන්න.

04. පුවත්පතක සංවිධිත ව්‍යූහය තුළ එකිනෙකාගේ කාර්යභාරය පැහැදිලි ව ප්‍රකාශිත ය. මීට අදාළ ව පුවත්පත් කර්තෘ මණ්ඩලයක විවිධ අංශ මොනවාදැයි විස්තර කරන්න.

05. 'සමාජ සුබසිද්ධිය උදෙසා විවිධ සංසිද්ධීන් අනාවරණය කිරීමෙහි නියැලෙන ගවේෂණාත්මක පුවත්පත් කලාවේදීන් මුහුණපාන අන්තරායවලින් ඔවුන් ආරක්ෂා කරගැනීම සමාජ වගකීමක් හා යුතුකමක් වේ.' විවරණය කරන්න.

06. 'උද්ධෘත හඬ පට (voice clips) විද්‍යුත් මාධ්‍ය ප්‍රවෘත්ති සම්පාදනයේ ශිල්ප ක්‍රමයක් මිස වගකීම්සහගත වාර්තාකරණයට ආදේශකයක් නොවේ.' නිදර්ශන සහිත ව සාකච්ඡා කරන්න.

*(අනෙක් පිටුවට)*

07. 'මානව හිමිකම් සුරැකීමට කැපවීම පුරවැසියන්ගේ කේවල නිදහස පිළිබඳ ප්‍රබල ආරක්ෂණයකි.' ශ්‍රී ලාංකේය ජනමාධ්‍ය භාවිතයට අදාළ ව අදහස් දක්වන්න.

08. පහත සඳහන් මාතෘකා අතරින් හතරක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

i. කාලගුණ විපර්යාස පිළිබඳ පුවත්
ii. පාර්ලිමේන්තු වාර්තාකරණය
iii. කර්තෘ සංසදයේ මාධ්‍ය ආචාරධර්ම සංග්‍රහය
iv. පුරවැසි ජනමාධ්‍යවේදය
v. වාර්තාකරණයේදී සී.සී.ටී.වී. උපයෝගීතාව
vi. ක්ෂණික ප්‍රවෘත්ති
vii. ප්‍රවෘත්ති මූලාශ්‍රයක් ලෙස කෙටි පණිවිඩ
viii. ඒ. එෆ්. පී. හෝ රොයිටර්ස්